# ⑦ ව්‍යාපාර අදහස් හා අවස්ථා - පිළිතුරු

## (1)

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ③ | 6. | ② | 11. | ① |
| 2. | ③ | 7. | ① | 12. | ③ |
| 3. | ① | 8. | ① | 13. | ② |
| 4. | ③ | 9. | ② | 14. | ③ |
| 5. | ④ | 10. | ③ | 15. | ④ |

## (2) පිළිතුරු

1. පරිසරයේ ඇති ගැටලුවකට විසඳුමක් වන පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතුවිල්ලකි .

2.

   1) ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කළ හැකි වීම
   2) පරිසරයේ මතුවන අවශ්‍යතා සපුරාලිය හැකි වීම
   3) වෙනස්වන අවශ්‍යතා සහ උවමනා වලට ප්‍රතිචාර දැක්විය හැකි වීම
   4) තරඟකාරිත්වයට සාර්ථකව මුහුණ දිය හැකි වීම

3.

   1) විනෝදාංශ හා ලැදියා තුළින්
   2) පුද්ගල දක්ෂතා සහ පළපුරුද්ද තුළින්
   3) වෙළෙඳපොළ සමීක්ෂණ තුළින්
   4) පාරිභෝගික ප්‍රතිචාර තුළින්
   5) ජනමාධ්‍යය මගින්

4.

   1) ඉල්ලුමක් පැවතීම
   2) අවශ්‍ය සම්පත් සපයා ගත හැකි වීම
   3) ආකර්ෂණීය ඉපයීමක් තිබීම
   4) නීති රීති වලට අනුකූල වීම

5.

   යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරාගැනීමට නම් ජනනය වූ ව්‍යාපාර අදහස් ඇගයීමට භාජනය කළ යුතුය . හොඳ ව්‍යාපාර අදහසක් තෝරා ගැනීම පියවර තුනකින් යුතු ක්‍රියාවලියක් වේ .

   1) සාර්ව විශ්ලේෂණය
      මතුපිටින් සලකා බලමින් වඩා යෝග්‍ය ව්‍යාපාර අදහස් 10ක් පමණ තෝරා ගැනීම වේ .

2) සූක්ෂම විශ්ලේෂණය

පළමු අදියරේ දී සලකා බැලූ සාධක ගැඹුරින් අධ්‍යනය කිරීම මෙහිදී සිදුවේ .පහත දක්වා ඇති නිර්ණායක ඔස්සේ ව්‍යාපාර අදහස් තුනක් පමණ තෝරා ගැනීම සිදුවේ .

<u>නිර්ණායක</u>

- වෙළෙඳපොළක් පැවතීම
- අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව
- අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගත හැකි බව
- අවදානම
- ශ්‍රමය සපයා ගැනීමේ හැකියාව

3) ශඳුඅත විශ්ලේෂණය

සූක්ෂම විශ්ලේෂණය අවසානයේ තෝරාගත් ව්‍යාපාර අදහස් එකින් එක වෙන වෙනම ගෙන ශඳුඅත විශ්ලේෂණය කිරීම මගින් ව්‍යවසායකයාට වඩාත් හොඳින් සහ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපාර අවස්ථාව හඳුනාගත හැකි වෙයි .

6.

1) වෙළෙඳපොළක් පැවතීම
2) අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව
3) අවශ්‍ය ප්‍රාග්ධනය සපයා ගත හැකි බව
4) අවදානම
5) ශ්‍රමය සපයා ගැනීමේ හැකියාව
6) රජයේ නීතිරීති ප්‍රතිපත්ති හා දිරිගැන්වීම්

7.

1) නව නිපැයුමක්
2) නව යන්ත්‍රයක්
3) නව ක්‍රියාවලියක්
4) ඉහත කරුණුවල සංකලනයක්
5) පවත්නා සොයා ගැනීමක වැඩිදියුණු කිරීමක් වේ.

8. **<u>ශක්තීන්</u>**

1) සම්පත් පැවතීම
2) දක්ෂ සේවකයන් සිටීම
3) නිෂ්පාදිත වල ඉහළ ගුණත්වය

**<u>දුර්වලතා</u>**

1) මූල්‍ය දුෂ්කරතා
2) යල් පැනගිය තාක්ෂණය
3) අමුද්‍රව්‍ය හිඟකම

**<u>අවස්ථා</u>**

1) වැඩි පාරිභෝගික පිරිසක් සිටීම
2) තරඟකරුවන් ඉවත්වීම
3) තාක්ෂණය දියුණු වීම
4) රාජ්‍ය දිරිගැන්වීම්

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

<u>තර්ජන</u>

1) අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම
2) අවාසි දායක නීතිරීති පැනවීම
3) ස්වභාවික ආපදා හා විපත්
4) ආර්ථිකය අයහපත් වීම
5) වසංගත රෝග ව්‍යාප්තිය

9. නව සොයා ගැනීමේ අයිතිය ආරක්ෂා කර ගැනීමට ලබා ගන්නා බලපත්‍රය වේ.

10. වසර 20 කි.

11. ව්‍යාපාර අදහස් සුලභය .විවෘතය .සෑම අදහසක්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ නොහැකිය .
ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ .ඒවා අනාවරණය කරගැනීම සියල්ලන්ටම කළ නොහැක .ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකිය.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව